**29-01-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේ සුමිහිරි පරමාත්ම පියාව සිහි කිරීමෙන් ඔබ සතෝප්‍රධාන් දේවතාවරුන් වේවි. සියල්ල රඳා පවතින්නේ ස්මරණ වන්දනාව මතයි.

**ප්‍රශ්නය:** පියාගේ ආකර්ෂණය දරුවන්ට දැනෙන්නාක් සේ සියලු දෙනාටම ආකර්ෂණයක් ඇති වන්නේ කුමන දරුවන් කෙරෙහි ද?

**පිළිතුර:** මල් බවට පත් වුණු අය වෙතටයි. දුර්ගුණ කියා දෙයක් ගැන කිසිවක් දන්නේවත් නැති මල් වන් කුඩා දරුවන් සේ ඔය දරුවනුත් මල් වුණු විට, ඔබලා පාරිශුද්ධ වුණු විට සෑම කෙනෙක්ම ඔබට ආකර්ෂණය වේවි. ඔබ තුළ කිසිම දූෂිත කටුවක් නොතිබිය යුතුයි.

ඕම් ශාන්ති. මෙය ඉතාමත් සුබම සුබ වූ සංගම යුගය බව ඔය ආධ්‍යාත්මික දරුවන් දන්නවා. ඉදිරි අනාගතයේ ඔබගේ ඉතාමත් උසස් වූ මුහුණු ඔබලාට පෙනෙනවා ද? ඔබගේ ඉතාමත් උසස් ඇඳුම් ආයිත්තම් ඔබට පෙනෙනවා ද? තමන් නැවතත් වතාවක් ලක්ෂ්මී නාරායන් වංශයේ ස්වර්ණමය යුගය, නව ලෝකය, සතුටින් පිරි දේශයට ගිහින් උතුම්ම උතුම් පිරිසක් බවට පත් වන බව ඔබලාට දැනෙනවා ද? මෙහි සිටිනා අතර මෙවන් සිතිවිලි ඔබට පහළ වෙනවා ද? ශිෂ්‍යයින් ඉගෙන ගන්නා විට තමන් ඉගෙන ගන්නේ කුමන පන්තියේදැයි කියා ඒ දරුවන් දන්නවා: මම නීතීඥවරයෙක් වෙන්නම්, මම මේ වගේ කෙනෙක් වෙන්නම්. ඒ ලෙසින්ම ඔබ මෙහි අසුන් ගත් විට තමන් විෂ්ණු වංශයට යන බව ඔබලා දන්නවා. විෂ්ණුගේ ස්වරූප දෙක නම් ලක්ෂ්මී හා නාරායනුයි. දේවතාවරයෙක් හා දේවතාවරියක්. ඔබලාගේ බුද්ධීන් දැන් අලෞකිකයි. මේ දේවල් වෙන කිසිම කෙනෙකුගේ සිහියේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ සියල්ල ඇත්තේ ඔය දරුවන්ගේ බුද්ධියේයි. මෙය සාමාන්‍ය සත්සන් පන්තියක් නොවෙයි. ඔබ මෙහි අසුන් ගෙන සිටින්නේ ශිවා කියා හඳුන්වනා සත්‍ය බාබාගේ ඇසුරේයි තමන් සිටින්නේ යන අවබෝධයෙනුයි. ශිව බාබාම පමණයි නිර්මාණකරු වන්නේ. නිර්මාණයේ මුල, මැද හා අග ගැන දන්නේ ඔහුම පමණක් වන අතර ඔහු අපට ඒ ඥානය ලබා දේ. එය හරියට ඔහු අපට ඊයේ සිදු වුණු දෙයක් ගැන කියනවා වගේයි. මෙහි සිටිනා අතර තමන් දැන් මෙහි පැමිණ සිටින්නේ නැවතත් තම තාරුණ්‍යය ලබා ගැනීමට එනම් තම ශරීර දේවතා ශරීර බවට පත් කර ගැනීමටයි කියා ඔබ සිහියේ තබා ගත යුතුයි. ජීවාත්මය කියනවා: මේ මගේ තමෝප්‍රධාන් මහළු ශරීරයයි. එය අතහැර දමා මා ලක්ෂ්මී හා නාරායන වගේ විය යුතුයි. ඔබගේ අරමුණ හා ඉලක්කය ඉතාමත් ඉහළයි. ඔබලාට උගන්වනා ගුරුවරයා අනිවාර්යෙන්ම ඉගෙන ගන්නා සිසුන්ට වඩා දක්ෂ කෙනෙක් විය යුතුයි. ඔහු අපට උගන්වා හොඳ ක්‍රියා කරනා ආකාරය කියා දෙනවා. එම නිසා ඔහු අනිවාර්යෙන්ම උසස් කෙනෙක් විය යුතුයි. ඉහළම ඉහළ දෙවියන් අපට උගන්වනා බව ඔබ දන්නවා. ඉදිරි අනාගතයේදී අපිත් ඒ වගේ දේවතාවරුන් වෙමු. දැන් මේ ඉගෙන ගන්නා දේ අනාගත නව ලෝකයටයි. වෙන කිසිම කෙනෙක් නව ලෝකය ගැන දන්නේවත් නැහැ. ලක්ෂ්මී හා නාරායන නව ලෝකයේ පාලකවරුන්ය යන්න දැන් ඔබගේ සිහියට ඇතුලු වෙනවා. එය අනිවාර්යෙන්ම නැවතත් සිදු විය යුතුයි. පරමාත්ම පියා පහදා කියනවා: මම ඔබට උගන්වා ඔබව සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් දේවතාවරුන් බවට පත් කරවනවා. දේවතාවරුන් අතරත් එක් එක් මට්ටම් තිබෙනවා. එය දිව්‍යමය රාජ්‍යයක් නේද? මුළු දවස පුරාම ඔබ මම ජීවාත්මයක්. ඉතාමත් අපිරිසිඳුවට සිටි ජීවයක් වන මා දැන් පාරිශුද්ධ වීම සඳහා පාරිශුද්ධ පියාව සිහි කරනවා කියා සිතිය යුතුයි. සිහි කිරීම යන්නෙහි අර්ථයත් ඔබ අවබෝධ කර ගත යුතුයි. ජීවාත්මයක් තම මිහිරි පියාව සිහි කරනවා. පරමාත්ම පියාම කියන්නේ: දරුවනි, මා සිහි කිරීමෙන් ඔබලා සතෝප්‍රධාන් දේවතාවරුන් වේවි. සියල්ල රඳා පවතින්නේ ස්මරණ වන්දනාව මතයි. ආධ්‍යාත්මික පියා අනිවාර්යෙන්ම අසාවි: දරුවනි, ඔබ කොයි තරම් දුරට මා සිහිපත් කරනවාද? මායා සමඟ සටන් කිරිමට සිදු වන්නේත් මෙම සිහි කිරීමේදියි. වන්දනාවක් නොවී සටනක් වෙන වෙලාවක ඔබටම එය අවබෝධ කර ගත හැකි වේවි. මෙහි බාධක රැසක් තිබෙනවා. ස්මරණ වන්දනාවේදී මායා නොයෙකුත් බාධක ගෙන එනවා. ඇය ඔබට සියල්ල අමතක කරවනවා. බාබා ඔබව සිහි කරමින් සිටිනා විට අපට නොයෙකුත් වර්ගයේ මායාගේ කුණාටු එනවා කියා ඔබ කියාවි. අංක එකේ කුණාටුව නම් ශාරීරික අවධානයයි. පසුව කාමරාගය. එතැනින් කෝපය, තණ්හාව, බැඳීම හා අහංකාරය. දරුවන් කියනවා: බාබා, ඔබව සිහි කරනා විට බාධක වලින් තොරව එය කිරිමට අප කෙතරම් උත්සාහ දැරුවත් කුණාටු ගණනාවක් එනවා. අද කේන්තියේ කුණාටුව, නැතිනම් තණ්හාවේ කුණාටුව. අද මම ඉතාමත් හොඳ මට්ටමකින් සිටියා. කිසිම කුණාටුවක් හැමුවේ නැහැ. මම මුළු දවස පුරාම ස්මරණ වන්දනාවේ සිට ලොකු සතුටක් අත් වින්දා. මම ඉතාමත් හොඳට

බාබාව සිහි කළා. බාබාව සිහි කරනා විට ඉබේටම සෙනෙහසේ කඳුළු වැටෙනවා. පරමාත්ම පියාව සිහි කිරීමෙන් ඔබ මිහිරි අයෙක් වේවි. මායාගේ රැවටිල්ලට හසු වීමෙන් තමන් පැමිණ සිටින්නේ කොතැනටදැයි කියා ඔය දරුවන්ට තේරුම් යාවි. එක් කල්පයකට දින මාස කීයක් තිබෙනවාදැයි කියා ඇතැම් දරුවන් ගණන් කරනවා. කල්පයක කාල පරාසය වසර සිය දහස් ගණනක් කියා කෙනෙක් කියතොත් කිසිම කෙනෙක්ට එය ගණනය කළ නොහැකි බව ඔබලා දන්නවා. මෙම ලෝක චක්‍රය දිගටම කැරකෙන බව පරමාත්ම පියා පහදා දී තිබෙනවා. මුළු කල්පයටම තමන් උපත් කීයක් ගන්නවාද වංශයට ඇතුළු වන්නේ කෙසේදැයි කියා ඔබලා දන්නවා. මේවා සම්පූර්ණයෙන්ම අලුත් කරුණුයි. මිනිසුන් ලෙසින් සිටිනා තමන් දැන් දේවතාවරුන් බවට පත් වෙමින් සිටිනවායි කියා ඔබ කියාවි. දේවතා තත්ත්වය ඉතාමත් ඉහළ තත්ත්වයකි. තමන් දැන් අද්විතීය වූ දැනුමක් ලබමින් සිටිනා බව ඔය දරුවන් දන්නවා. අපට උගන්වන කෙනාත් අද්විතීයයි. රූපයක් නැහැ. ඔහුට භෞතික රූපයක් නැහැ. ඔහු සෑම විටම අශාරීරිකයි. නාටකයේ ඔහුට හිමි වී ඇති හොඳ චරිත කොටස දෙස බලන්න. පරමාත්ම පියා අපට උගන්වන්නේ කෙසේද? ඔහුම කියනවා: මම මෙන්න මේ ශරීරයට ඇතුළු වෙනවා. ඔහු ඇතුළු වන්නේ කාගේ ශරීරයටදැයි කියාත් ඔහු කියනවා. මිනිස්සු කලබලයට පත් වෙනවා. ඔහු හැමදාම පැමිණෙන්නේ එකම ශරීරයට ද? කෙසේ වෙතත් නාටකය මෙයයි. එහි කිසිම වෙනසක් සිදු විය නොහැකියි. මේ දේවල් වලට ඇහුම්කන් දී ඒවා ධාරණය කරගෙන පසුව ශිව බාබා උගන්වන ආකාරයෙන්ම ඒවා අන් අයටත් කියා දෙන්නේ ඔබලාම පමණයි. අප එය අන් ජීවාත්මයන්ට උගන්වනවා. ඉගෙන ගන්නේ ජීවයයි. ඉගෙන ගෙන අන් අයට උගන්වන්නේ ජීවාත්මයයි. ජීවය ඉතාමත් අගනා දෙයකි. ජීවාත්මය අවිනාශීයි. අමරණීයයි. විනාශ වන්නේ ශරීරය පමණයි. ජීවයන් වන අප අපගේ පරමාත්ම පියා, පරමාත්ම ජීවයෙන් දැනුම ලබා ගන්නෙමු. නිර්මාණකරුත්, නිර්මාණයේ මුල, මැද හා අග ගැනත් උපත් 84 ගැනත් වන දැනුම අප ලබමින් සිටිනවා. කවුද මෙම දැනුම ලබන්නේ? ජීවාත්මයන්. ජීව අවිනාශියි. බැඳීමක් තිබිය යුත්තේ අවිනාශී දේ වලට පමණයි. විනාශ වන සුළු දෙයකට නොවෙයි. බොහෝ කාලයක් තිස්සේ ඔබ විනාශ වන සුළු දේ වලට බැඳීමෙන් සිටියා. තමන් සෑම කෙනෙක්ම ජීවාත්මයක් බවත් ශාරීරික අවධානය අතහැර දැමිය යුතු බවත් ඔබ දැන් තේරුම් ගෙන තිබෙනවා. ජීවය වන මම මේ දේ කළා කියා ඇතැම් දරුවන් ලියනවා. ජීවය වන මම අද මේ දේශනය දුන්නා. ජීවය වන මම අද ඉතාමත් හොඳින් බාබාව සිහි කළා. ඔහු පරමාත්ම ජීවයයි. දැනුමින් පිරි කෙනායි. ඔහු ඔය දරුවන්ට විශාල ඥානයක් දෙනවා. අශාරීරික ලෝකයත් සූක්ෂම කලපයත් ගැන ඔබ දන්නවා. තම සිහියේ ඇති දේ ගැන මිනිසුන්ට කිසිම අවධානයක් නැහැ. නිර්මාණකරු කවුද යන්න පිළිබඳව ඔබගේ බුද්ධිය අවබෝධයෙනුයි සිටින්නේ. මෙම මානව ලෝකයේ නිර්මාණකරුව සිහි කරනා නිසා ඔහු අනිවාර්යෙන්ම ක්‍රියාකාරී වීමට මෙහි පැමිණිය යුතුයි. වෙන කිසිම මිනිසෙක් ජීවය හෝ පරමාත්ම ජීවය සිහි නොකරනා බව ඔබ දන්නවා. මෙම දැනුම ඔබට දෙන්නේ පරමාත්ම පියාම පමණයි. තමන් ජීවාත්ම සත්තාවක් බව සලකන්න. ශරීරයක් බව සලකමින් පැමිණ ඔබ දැන් උඩ යට පෙරළිලායි සිටින්නේ. ජීවාත්මය සත්‍යයි. සජීවීයි. ප්‍රමෝදයේ ප්‍රතිමූර්තියයි. ඉහළම ප්‍රශංසාව ජීවය ගැනයි. එකම එක පියාගේ ජීවය පිළිබඳ විශාල ගුණ වර්ණනාවක් තිබෙනවා. දුක නැති කර සතුට දානය කරන්නා ඔහුම පමණයි. දුක නැති කර සතුට දානය කරන්නායි කියා හෝ ඥාන සාගරය යයි කියා මදුරුවන්ට කියන්නේ නැහැනේ. නැහැ මෙම ගුණ වර්ණනාව අයිති පරමාත්ම පියාටයි. සියලු දෙනාගේ දුක නැති කර ඔවුනට සතුට දෙන පරමාත්ම පියාගේ දරුවන් වන නිසා ඔබ සෑම කෙනෙක්මත් දුක නැති කර සතුට දානය කරන්නන් වෙනවා නේද? ඒත් කල්ප භාගයකට වෙන කිසිම කෙනෙකුට මෙම ඥානය නැහැ. දැනුමින් පිරි කෙනා වන්නේ එකම එක පරමාත්ම පියා පමණයි. අපට කිසිම දැනුමක් නැහැ. එකම එක පියා ගැනවත් අපි දන්නේ නැති නම් වෙන මොනවා ගැන දැන ගන්නද? මෙම දැනුම පළමුවෙන්ම ගන්නේ ඔබලා බව ඔබට දැන් දැනෙනවා. මීට පෙර ඔබ කිසිම දෙයක් දැනගෙන සිටියේ නැහැ. කුඩා බිළිඳෙකුට කිසිම ඥානයක් හෝ කිසිම දුර්ගුණයක් නැහැ. එමනිසා, ඒ බිළිඳාගේ පාරිශුද්ධත්වය නිසා ඔහු උතුම් ජීවයක් කියා කියනවා. වයසින් කුඩා වන තරමට දරුවන් අංක එකේ මල් වෙනවා. එය හරියට ඔහුගේ කර්මතීත් අවධිය වගේයි. ක්‍රියා හෝ පාප ක්‍රියා ගැන ඔහු දන්නේ නැහැ. ළදරුවෙක් දන්නේ තමා ගැන පමණයි. මලක් වන ඔහු බාබා ඔබව ආකර්ෂණය කර ගත්තා වගේ සෑම කෙනෙක්වම තමා දෙස ආකර්ෂණය කර ගන්නවා. පරමාත්ම පියා පැමිණ සිටින්නේ ඔබ සෑම කෙනෙක්වම මල් බවට පත් කරවීමටයි. ඔබලා තුළ ඉතාමත් නරක කටු තිබෙනවා: පංච මහා පාපයන්ගේ කටු. මේ කාලයේදී ඔබ මල් කටු ගැන දැන ගන්නවා. කටු කැලෑවලුත් තිබෙනවා. කටු ගසක කටු ඉතාමත් විසයි. ඒ කටු වලින් විවිධ දේ හදනවා. ඒ කටු වලට මිනිසුන්ව සමාන කරනවා. පරමාත්ම පියා පහදා කියනවා: මේ කාලයේදී මහා විශාල දුක් ගෙන දෙන මිනිස් කටු රැසක් සිටිනවා. මෙන්න මේ නිසා තමයි මෙම ලෝකය දුක්ඛිත ලෝකයක් කියා කියන්නේ. පරමාත්ම පියා සතුට දානය කරන්නායි කියාත් කියනවා. මායා,

රාවණ දුක දානය කරන්නායි. ස්වර්ණමය යුගයේ මායා නැහැ. ඒ නිසා මේ දේවල් එහි නැහැ. නාටකයක එකම ජවනිකාව දෙවරක් රඟ දැක්වෙන්නේ නැහැ. වේදිකා ගත වන සෑම ජවනිකාවක්ම අලුත් ජවනිකාවක් බව ඔබගේ සිහියේ තිබෙනවා. මේ ගැන මඳක් සිතා බලන්න: ස්වර්ණමය යුගයේ සිට මේ වන තෙක් දින වෙනස් වෙමින් යන අතර මුලු ක්‍රියාවලියම වෙනස් වෙමින් යනවා. වසර 5000 කට පටිගත ක්‍රියාවලිය ජීවාත්මය තුළ සනිටුහන් වී ඇති අතර එය වෙනස් කළ නොහැකියි. සෑම ජීවාත්මයක් තුළම ඔවුනට ආවේණික වූ චරිත කොටස පටිගත වී තිබෙනවා. මේ සුළු කාරණය කිසිම කෙනෙකුට තේරුම් ගත නොහැකියි. මුල, මැද හා අග ගැන ඔබ දැන් දන්නවා. මෙය පාසලක් නේද? ලෝකයේ මුල, මැද හා අග ගැන ඔබ දැන ගත යුතුයි. මෙය පියාව මතක් කර පාරිශුද්ධ වීමට ඇති දැනුමක් වෙනවා. මීට පෙර ඔබ තමන් මේ තත්ත්වයට පත් විය යුතුයි කියා දැනගෙන සිටියාද? පරමාත්ම පියා සෑම දෙයක්ම ඉතාමත් පැහැදිලිව කියා දෙනවා. ඔබ ඒ පළමු තත්ත්වයේ සිටියා. පසුව ක්‍රම ක්‍රමයෙන් පහළට පැමිණ දැන් මේ තැනට ඇද වැටී සිටිනවා. බලන්න ලෝකය පත් වී ඇති තත්ත්වය. මිනිසුන් රාශියක්. ලක්ෂ්මී හා නාරායනගේ රාජ්‍යය කොයි වගේ වේවිද කියා මඳක් සිතා බලන්න. ඔවුන් ජීවත් වන මාළිගා දියමන්ති, මුතු මැණික් ඔබ්බවා සෑදූ ඒවායි. තමන් දැන් දෙව්ලොව වාසීන් වෙමින් සිටිනවාය යන්න ඔබගේ සිහියට ඇතුළු වෙමින් තිබෙනවා. එහිදී ඔබලා තම තමන්ගේ මාළිගා සාදා ගනීවි. පොත්පත් වල ක්‍රිෂ්ණාගේ රන් පුරය වන ද්වාරකය ඉබේ මතු වෙනවා කියා පෙන්වා තිබෙනවා වගේ එහිදී එහෙම වෙන්නේ නැහැ. ග්‍රන්ථ කියන වචනය දිගටම යෙදී තිබෙනවා. එයට වෙන දෙයක් කියන්න නැහැ. අනිකුත් පොත්පත් ඉගෙන ගැනීමට ගන්නා ඒවායි. තවත් පොත් වර්ගයක් තමයි නවකතා. නමුත් මේවා හඳුන්වන්නේ ග්‍රන්ථ නැතිනම් ආගමික ග්‍රන්ථ ලෙසිනුයි. අනිකුත් පොත් ඇත්තේ අධ්‍යයනයටයි. ග්‍රන්ථ හදාරන්නන් බැතිමතුන් කියා හඳුන්වනවා. භක්තිය හා ඥානය කියා දෙකක් තිබෙනවා. නිරාශාව ඇත්තේ භක්තියේ ද? ඥානයේ ද? අනිවාර්යෙන්ම භක්තියේ කියා කියාවි. ඔබව ඉතාමත් උතුම් උත්තමයින් බවට පත් කරවනා ඥානය දැන් ඔබ ලබමින් සිටිනවා. පරමාත්ම පියා ඔබලාව සතුට දානය කරන්නන් බවට පත් කරවනවා. සතුටු දේශය දෙව්ලොව වේ. ඔබ සතුටේ දේශයට යමින් යමින් සිටිනා නිසා ඔහු ඔබට උගන්වනවා. මෙම ඥානය ලබා ගන්නේ ඔය ජීවාත්මයනුයි. ජීවයකට ආගමක් නැහැ. ජීවය ජීවයකුයි. ජීවයක් ශරීරයකට ඇතුළු වුණු විට ශාරීරික ආගම වෙනම දෙයක් වෙනවා. ජීවයක ආගම කුමක් ද? ජීවය තිතක් වැනියි. සාමයේ ප්‍රතිමූර්තියකුයි. ජීවයන් සාම දේශයේ, මුක්ති දේශයේ වැසියනුයි. පරමාත්ම පියා දැන් පැහැදිලි කරන්නේ: සෑම දරුවෙකුටම අයිතියක් තිබෙනවා. අනිකුත් ආගම් වලට හැරුණු දරුවන් රැසක් සිටිනවා. ඔවුන් නැවතත් මතු වී තම මුල්ම ධර්මයට පැමිණේවි. දේවතා ධර්මය අතහැර දමා වෙනත් ආගම් වලට ගිය අය සෑම කෙනෙක්ම තම තමන්ගේ තැන් වලට ආපසු පැමිණේවි. වෙන කිසිම කෙනෙකුට මේ දේවල් තේරුම් ගත නොහැකියි. පළමුවෙන්ම පරමාත්ම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. සෑම කෙනෙක්ම පටලැවිල්ලට පත් වන්නේ මෙහිදියි. තමන්ට උගන්වන්නේ කවුදැයි කියා දැන් ඔය දරුවන් දන්නවා. පරමාත්ම පියා උගන්වනවා. ක්‍රිෂ්ණා ශාරීරික අයෙකි. මේ බ්‍රහ්මාට දාදා කියා කියනවා. සෑම කෙනෙක්ම සහෝදරයින්ය. පසුව සියල්ල රඳා පවතින්නේ තත්ත්වය මතයි. මේ සහෝදරයෙකුගේ ශරීරයක් මෙය සහෝදරයෙකුගේ ශරීරයක්. ඔබ දැන් මේ ගැනත් දන්නවා. ජීවාත්මයන් ඉතාමත් කුඩා තාරුකාවකි. මේ මුළු ඥානයම ඇත්තේ කුඩා තාරුකාවකයි. ශරීරයකින් තොරව තරුවකට කතා කරන්න බැහැ. චරිතයක් රඟ දැක්වීම සඳහා තරුවකට ශරීරයක් අවශ්‍යයි. තරු ලෝකය වෙනම ලෝකයක්. පසුව ජීවාත්මයක් පැමිණ ශරීරයක් ගන්නවා. එය ජීවාත්මයන්ගේ නිවහනයි. ජීවය කුඩා තිතක් වන අතර ශරීරය විශාල වස්තුවකි. එමනිසා, මිනිස්සු ඒ ශරීරය සිහි කරනවා. ඔබ දැන් සිහි කළ යුත්තේ එකම එක පරමාත්ම පියා, පරමාත්ම ජීවය පමණයි. ජීවාත්මයන් හා පරමාත්ම ජීවය අතර මුණගැසීම සිදුවන විට ඔහු සත්‍යය වෙනවා. ජීවාත්මයන් බොහෝ කාලයකට පරමාත්ම ජීවයෙන් වෙන්ව සිටියා කියා සඳහන් වී තිබෙනවා. අපි බාබාගෙන් වෙන් වුණා. තමන් කොපමණ කාලයකට වෙන්ව සිටියාදැයි කියා ඔබට මතකද? සෑම කල්පයකදීම ඔබට කිය කිය සිටි දේ පරමාත්ම පියා පැමිණ නැවතත් කියා දෙනවා. එහි සුළු හෝ වෙනසක් සිදු විය නොහැකියි. තත්පරයක් තත්පරයක් පාසා සිදු වන සෑම දෙයක්ම අලුත් දෙයකි. පසු වන සෑම තත්පරයක්ම සෑම මිනිත්තුවක්ම ඔබ අතහැර දමා යනවා වගේයි. ඒවා දිගටම පසුවෙමින් යනවා: ඔබ අවුරුදු, දින, මිනිත්තු, තත්පර ගණනාවක් පසු කර ආවායි කියා ඔබට කිව හැක්කේ එවිටයි. හරියටම වසර 5000 ක් වන එය අංක එකෙන් ඇරඹෙනවා. නිවැරදිම ගිණුමක් තිබෙනවා. සෑම මිනිත්තුවක්ම තත්පරයක්ම සටහන් වෙනවා. ඔබ උපත් කීයක් ගෙන තිබෙනවාද කියා කවුරු හෝ ඇසුවහොත් ගණන් කර කියන්න. අංක එකේ උපත ගන්නේ ක්‍රිෂ්ණායි. ශිවාගේ සෑම මිනිත්තුවක්ම තත්පරයක්ම ගණන් කරන්න බැහැ. ක්‍රිෂ්ණාගේ දිනය, වේලාව, මොහොත සඳහන් කර තිබෙනවා. මිනිස් ඔරලෝසුවක මිනිත්තු තත්පර වෙනස් වෙන්න පුළුවන් නමුත් ශිව බාබාගේ සම්ප්‍රාප්තියේ

සුළු හෝ වෙනසක් සිදු විය නොහැකියි. ඔහු පැමිණෙන්නේ කවදාදැයි කියාවත් කිව නොහැකියි. බාබාට දර්ශන පහළ වුණු වෙලාවේ ඔහු පැමිණියායි කියන්න බැහැ; නැත. සාමාන්‍ය වශයෙන් අනුමාන කර කීමක් පමණයි කළ හැක්කේ. බාබා අහවල් අහවල් කෙනා බවට පත් වෙනවායි කියා දර්ශන දුටු මොහොතේදී, ඔහු ඇතුලු වුණායි කියා කිව නොහැකියි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සතුටු දේශයට යාමට නම් සතුට දානය කරන්නෙක් වන්න. සෑම කෙනෙකුගේම දුක නැති කර සෑම කෙනෙකුටම සතුට දෙන්න. කිසිදා දුක ගෙන දෙන කටුවක් නොවන්න.
2. මෙම විනාශ වන සුළු ශරීරයේ සිටිනා ජීවාත්මය ඉතාමත් වටිනා එකකි. එය අමරණීයයි. අවිනාශීයි. එමනිසා, අවිනාශී දෙයට සෙනෙහස ඇතිව සිටින්න. ශාරීරික අවධානය අවසන් කර දමන්න.

**වරදානය:** ඔබ ජීව මරණයට පත්වීමෙන් බන්ධන වලින් නිදහස් වී ඔබගේ මුල් සහ සදාතනික ස්වරූප පිළිබඳ අවධාන තුළින් අන් අයට බන්ධනයෙන් නිදහස් වීමට ඉඩ සලසත්වා.
පරමාත්ම පියා මෙම ශරීරය ණයට ගෙන කිසිදු බන්ධනයක් නොමැතිව සිටින සේම, ඒ හා සමානව ජීව මරණය ලද ඔය දරුවන්, ඔබේ ශරීර, සංස්කාර සහ ස්වභාවයේ ඕනෑම බන්ධනයකින් නිදහස් විය යුතුය. ඔබට අවශ්‍ය ඕනෑම වේලාවක ඔබට අවශ්‍ය ඕනෑම සංස්කාරයක් ධාරණය කර ගන්න. පරම පියා බන්ධනයෙන් නිදහස් වන්නා සේම, ඔබත් ඒ ආකාරයෙන්ම බන්ධනයෙන් නිදහස් විය යුතුය. අශාරීරික ලෝකයේ අවධිය තුළ ඔබව ස්ථාවර කර පසුව පහළට එන්න. ඔබේ මුල් සහ සදාතනික ස්වරූපය පිළිබඳව අවධානයෙන් සිටින්න. අවතරණය වූ ජීවාත්මයක් ලෙස ක්‍රියා කරන්න, එවිට අනෙක් අය ඔබව අනුගමනය කරනු ඇත.

**පාඨය:** ස්මරණයේ සිටීමෙන් පරිසරය බලවත් කිරීම යනු ඔබේ මනසින් සේවය කිරීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

ඔබට ඕනෑම ආකාරයක බැඳීමක් තිබුණත්, එය සිතිවිලි, නෑ සබඳතා, සබැඳියාවන් හෝ ඔබේම විශේෂතා ආකාරයෙන් වේවා, ඕනෑම ආකාරයක බැඳීමක් ඔබව යම් ආකාරයක බැඳීමකට බැඳ තබයි. එම බන්ධනය ඔබට අශරීරික වීමට හෝ ලෝක දානපතියෙකු වීමට ඉඩ නොදේ. එමනිසා, පළමුවෙන්ම, සියලු බැඳීම් වලින් නිදහස් වන්න, මන්ද, එවිට පමණයි ඔබට මුක්තියේ සහ ජීවන මුක්තියේ උරුමය ලෝකයට ලබා දිය හැකි වන්නේ.